# ආබාධිත බව පිළිබඳ ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රියාකාරී සැලැස්ම

## බහු ආංශික රාමුවක්

සකස් කරන ලද්දේ

සමාජ සේවා අමාත්‍යාංශය

සෞඛ්‍ය අමාත්‍යාංශය

අනුමැතිය : 2014 ජනවාරි

ශ්‍රී ලංකාවේ ආබාධිතබව පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම –

| පළමුවැන්න: [illegible] | |
|---|---|
| 1 තොරතුරු, දැනුම, ජීවන කුසලතා හා ජීවිත සැලසුම් සඳහා ප්‍රවේශය සැලසීම මගින් පුද්ගල / පෞද්ගලික වර්ධනය | 01 |
| 2 දෛනික ජීවිතය සඳහා උපකාරය සහ සහය ලබා දීම මගින් පවුල් හා ප්‍රජා දිවියක් භුක්ති විඳීම | 02 |
| 3 උපදේශන හා පෙළඹවීම ඇතුළු කණ්ඩායම් සැදීම, සහභාගිත්වය හා නියෝජනය | 02 |
| 4 සන්නිවේදනය හා තොරතුරු | 03 |
| 5 දේශපාලන අයිතිවාසිකම් | 04 |
| 6 නෛතික රැකවරණය | 04 |
| 7 දුගීබව තුරන් කරලීම හා සමාජ ආරක්ෂණය | 04 |

| දෙවැන්න: සෞඛ්‍යය හා පුනරුත්ථාපනය | |
|---|---|
| 1 ප්‍රතිපත්ති, නීති හා සැලසුම් | 06 |
| 2 වෛද්‍ය හා සෞඛ්‍ය රැකවරණ සලසන්නන් | 07 |
| 3 විශේෂඥ සේවාවන්ට ප්‍රවේශය | 08 |
| 4 සෞඛ්‍ය රැකවරණ පහසුකම්වලට ප්‍රවේශය | 09 |
| 5 පූර්ව හඳුනාගැනීම හා මැදිහත්වීම | 09 |
| 6 මානසික සෞඛ්‍ය අවශ්‍යතා | 09 |
| 7 ශ්‍රවණ ආබාධ හා බිහිරි බව | 10 |
| 8 දෘෂ්‍ය ආබාධ හා අන්ධබව | 10 |
| 9 ශාරීරික ආබාධිත බව බුද්ධිමය ආබාධිත බව සහ වෙනත් වර්ධන ආබාධ සහ චර්යා ගැටළු | 10 |
| 10 ආධාරක තාක්ෂණ හා උපකරණ | 11 |
| 11 පිරිවැය හා දැරිය හැකි බව | 11 |
| 12 දේශීය වෛද්‍ය | 11 |

| තුන්වැන්න: අධ්‍යාපනය | |
|---|---|
| 1 ප්‍රතිපත්ති, නීති, උපක්‍රම හා සැලසුම් | 13 |
| 2 මධ්‍යස්ථානය පදනම් වූ මුල් ළමා විය අධ්‍යාපනය (ECE) | 14 |
| 3 ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපනය | 15 |
| 4 අවිධිමත් අධ්‍යාපනය | 18 |
| 5 උසස් අධ්‍යාපනය | 18 |

| හතරවැන්න: වැඩ හා සේවා නියුක්තිය | |
|---|---|
| 1 වැඩ, සේවා නියුක්තිය හා වෘත්තීය පුහුණුව සම්බන්ධ ජාතික ප්‍රතිපත්ති, නීති, උපාය මාර්ග සහ සැලසුම් | 20 |
| 2 වැඩ හා සේවා නියුක්තිය සඳහා සමාන ප්‍රවේශය | 20 |
| 3 වැඩ සඳහා මාර්ගෝපදේශ හා උපදේශන සහාය කිරීම | 21 |
| 4 වෘත්තීය පුහුණුව හා ස්ථාපනය | 21 |
| 5 ස්වයං සේවා නියුක්තිය හා ක්ෂුද්‍ර මූල්‍ය | 22 |
| 6 වේතන සේවා නියුක්තිය | 23 |
| 7 සේවා ස්ථානයේ ආබාධිත බව කළමනාකරණය කිරීම | 24 |

| පස්වැන්න: ප්‍රධාන ධාරාගත කිරීම හා ප්‍රවේශ පහසුකම් සහිත පරිසරය | |
|---|---|
| 1 ප්‍රවාහනය | 25 |
| 2 ගොඩනැගූ පරිසරය | 26 |
| 3 සමාජ පරිසර පිළිබඳ දැනුම හා ආකල්ප | 27 |
| 4 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | 28 |
| 5 මානව සම්පත් | 28 |
| 6 නේවාසික රැකවරණ | 28 |
| 7 නිවාස | 30 |
| 8 ක්‍රීඩා | 30 |
| 9 සංස්කෘතික පරිසරය | 30 |
| 10 ආපදා කළමනාකරණය | 31 |
| 11 චාරිකා හා සංචාරක ව්‍යාපාරය | 31 |
| 12 සහශ්‍ර සංවර්ධන අරමුණු | 31 |

| හයවැන්න: දත්ත හා පර්යේෂණ | |
|---|---|
| 1 ආබාධිත බව කළමනාකරණ තොරතුරු පද්ධතිය (DMIS) | 32 |
| 2 ජාතික ජනසංගණනය මගින් තොරතුරු රැස් කිරීම | 32 |
| 3 කෙරිගෙන යන දත්ත රැස් කිරීමේ ක්‍රමවේද | 32 |
| 4 පර්යේෂණයන්හි ආබාධ සහිත පුද්ගලයන්ගේ කාර්ය භාරය | 33 |
| 5 පර්යේෂණ හා ඇගැයීම් භාවිතාවන් | 33 |

| හත්වැන්න: සමාජ හා ආයතනික ගැලපුම් | |
|---|---|
| 1 ආබාධිත බව පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම, සම්බන්ධීකරණය කිරීම, අධීක්ෂණය කිරීම හා ඇගැයීම | 34 |
| 2 ආංශික ප්‍රතිපත්ති, සැලසුම්, අයවැය ලේඛන සහ ක්‍රියාත්මක කිරීම | 34 |
| 3 ආබාධිත බව පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම විමධ්‍යගත ලෙස ක්‍රියාත්මක කිරීම | 35 |
| 4 ප්‍රජා මූලික පුනරුත්ථාපනය (CBR) | 36 |
| 5 රාජ්‍ය නොවන හා පුද්ගලික අංශ | 37 |
| 6 ආබාධිත බව හා සම්බන්ධ කටයුතුවල වෘත්තීය මට්ටම් හා චර්යා ධර්ම | 37 |
| 7 ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ ප්‍රඥප්තිය සහ වෛකල්පික ලේඛනය | 37 |

# ශ්‍රී ලංකාවේ ආබාධිත බව පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම (NAPD)

## ක්‍රියාකාරකම්, ප්‍රධාන කාර්ය ඉටු කිරීමේ දර්ශක, කාල රාමු සහ වගකිවයුතු ආයතන සහිත තේමා හා කේන්ද්‍රීය ක්ෂේත්‍ර

### පළමුවන තේමා ක්ෂේත්‍රය: බලගැන්වීම

ආබාධිත බව පිළිබඳ ජාතික ප්‍රතිපත්ති ප්‍රකාශය:
"ආබාධිත බව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය මගින්, සමාජ සාධාරණත්වයේ නාමයෙන් ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම හා ආරක්ෂා කිරීම කරනු ලැබේ. පරිපූර්ණ හා තෘප්තිමත් ජීවිතයක් ගත කිරීමේ හා ශ්‍රී ලංකාවේ සමාන පුරවැසියන් වශයෙන් තම දැනුම අත්දැකීම් හා සුවිශේෂී නිපුණතා හා හැකියාවන් ජාතික සංවර්ධනය සඳහා දායක කිරීමේ අවස්ථාවන් ඔවුනට ලැබෙනු ඇත"

ප්‍රතිපත්තියේ සෑම අංශයක්ම ආවරණය කරන මූලධර්ම අතරින් එකක් වන්නේ "ආබාධ සහිත තැනැත්තන් සහ ඔවුන්ගේ සංවිධාන හා දෙමාපිය සංවිධාන බලගැන්වීම" යි. එය ඵලදායී ලෙස ක්‍රියාවට නැංවීමේ ලා මූලික වන්නේ බලගැන්වීමයි.

| | කේන්ද්‍රීය ක්ෂේත්‍රය | අපේක්ෂිත ප්‍රතිඵලය | ක්‍රියාකාරකම් | ප්‍රධාන කාර්ය ඉටු කිරීමේ දර්ශකය | කාල රාමුව | වගකිවයුතු ආයතන |
|---|---|---|---|---|---|---|
| 1 | තොරතුරු, දැනුම, ජීවන කුසලතා සහ ජීවිත සැලසුම් සඳහා ප්‍රවේශය මගින් පුද්ගල / පෞද්ගලික වර්ධනය | 1.1 (i) ආබාධ සහිත ළමුන්ට, වැඩිහිටියන්ට සහ වැඩිහිටි පුද්ගලයන්ට, ගැහැණු හා පිරිමි ළමුන්ට, කාන්තාවන්ට හා පිරිමින්ට පෞද්ගලික සංවර්ධනය සඳහා අවස්ථා තිබීම<br>1.1 (ii) පුද්ගලයෝ හා පවුල් තම අයිතිවාසිකම්, තමන්ට ලබාගත හැකි සේවාවන් හා අවස්ථා මොනවාද හා ඒවාට ප්‍රවේශය ලැබිය හැක්කේ කෙසේද යන්න දැනගැනීම<br>1.1.(iii) ආබාධ සහිත තැනැත්තන්ට තම සෞඛ්‍යය හා අනාගතය කළමනාකරණය කර ගැනීමට වඩා හොඳින් හැකියාව ඇත. | 1.1a ගැටලු කෙරෙහි ඵලදායී ලෙස ආමන්ත්‍රණය කරන බව සහතික කරලීම සඳහා ප්‍රජා මූලික පුනරුත්ථාපනය, නිවස මූලික කරගත් රුකවරණය සහ මුල් ළමාවිය අධ්‍යාපන උපාය මාර්ග සහ අනෙකුත් පවත්නා සේවාවන් සමාලෝචනය කිරීම | සමාලෝචනය සම්පූර්ණ කිරීම | මාස 6 ක් ඇතුළත | සමාජ සේවා අමාත්‍යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය, ළමා අභිවෘද්ධි හා කාන්තා කටයුතු අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය, ආබාධ සහිත පුද්ගලයන්ගේ සංවිධාන, පළාත් සභා, රාජ්‍ය නොවන සංවිධාන |
| | | | 1.1b සමාලෝචනය මත පදනම්ව, උපාය මාර්ග ශක්තිමත් කිරීම හා ව්‍යාප්ත කිරීම | එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ප්‍රජා මූලික පුනරුත්ථාපන වැඩසටහන්වල ප්‍රතිලාභී වන ප්‍රජාවන් සංඛ්‍යාව | මාස 6+ පසු ආරම්භ කිරීම | |
| | | | | හමු වූ හා බලගැන් වූ පුද්ගලයන්ගේ සංඛ්‍යාව | (+ = කෙරී ගෙන යන) | |
| | | | 1.1c පොදු මහජනතාව අතර දැනුම වර්ධනය කිරීමේ (දැනුවත්භාවය ඇති කිරීම) වැඩසටහන් පැවැත්වීම | පොදු මහජනතාව සඳහා දැනුම වැඩිකිරීමේ වැඩසටහන් සංඛ්‍යාව | වසර 2 + පසු ආරම්භ කිරීම | |
| | | | 1.1d වෘත්තියවේදීන් අතර දැනුම | වෘත්තියවේදීන් සඳහා වැඩසටහන් සංඛ්‍යාව | වසර 3 + පසු | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | 1.1.(iv) ස්වයං උපදේශනය සඳහා ආබාධ සහිත තැනැත්තන්ට නිපුණතා ඇත<br><br>1.1 (v) ප්‍රජා සාමාජිකයෝ ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් පිළිබඳ දැනුවත් වන අතර ඒවා පිළිගනිති. ඔවුහු අයිතිවාසිකම් පුරුකීම හා මූදුන් පමුණුවා ගැනීම සඳහා සහාය පළ කරති. | වර්ධනය කිරීමේ වැඩසටහන් පැවැත්වීම | හමු වූ වෘත්තීයවේදීන් සංඛ්‍යාව | ආරම්භ කිරීම | |
| | | | 1.1e ආබාධ සහිත තැනැත්තන් අතර දැනුම වැඩීමේ වැඩසටහන් පැවැත්වීම | ආබාධ සහිත තැනැත්තන් සඳහා වැඩසටහන් සංඛ්‍යාව<br>හමු වූ ආබාධ සහිත තැනැත්තන් සංඛ්‍යාව | | |
| | | | 1.1f ජාතික සමාජ සංවර්ධන ආයතනය විසින් ඉදිරිපත් කරන ලද සම්පත් නාමාවලිය යාවත්කාලීන කිරීම හා එය ලබා ගත හැකිවීම | සම්පත් නාමාවලිය යාවත්කාලීන කිරීම<br>බෙදා හරින ලද සංඛ්‍යාව | වසර 3 ඇතුළත | |
| | | | 1.1g ප්‍රවේශ විය හැකි ආකෘතිවල (විශාල අකුරු, බ්‍රේල්, පහසුවෙන් කියවිය හැකි භාෂාව, සංඥා භාෂාව, දෘශ්‍ය මාධ්‍ය යනාදිය) තොරතුරු ඉදිරිපත් කිරීම | ප්‍රවේශ විය හැකි සංස්කරණ සංඛ්‍යාව | වසර 2 + පසු ආරම්භ කිරීම | |
| 2 | දෛනික ජීවත්වීම සඳහා සහාය හා උපකාරය ඇතිව පවුල් හා ප්‍රජා ජීවිතය භුක්ති විඳීම | 2.1 ප්‍රජා මූලික පුනරුත්ථාපනය, තිවස පදනම් කරගත් රැකවරණය, මුල් ළමාවිය අධ්‍යාපන උපාය මාර්ග ශක්තිමත් කිරීම හා සංවර්ධනය කිරීම | 2.1a ප්‍රජා මූලික පුනරුත්ථාපනය, නිවස පදනම් කරගත් රැකවරණය, මුල් ළමාවිය අධ්‍යාපන උපාය මාර්ගවල ඵලදායීබව හා බලපෑම තක්සේරු කිරීම සඳහා ඒවා සමාලෝචනය කිරීම හා නිර්දේශ ඉදිරිපත් කිරීම | වාර්තාව ලබාගත හැකිවීම | මාස 6 ඇතුළත | |
| | | | 2.1b සමාලෝචනය පදනම් කර ගනිමින් ක්‍රියාවන් ක්‍රියාත්මක කිරීම | හමු වූ පුද්ගලයන් සංඛ්‍යාව | මාස 6 + ඇතුළත | |
| | | | 2.1c පවුලේ ආධාරයක් නොමැති ළමුන්ට, තරුණයන්ට හා වැඩිහිටියන්ට ප්‍රජා නිවාස හා ජීවිකාවන් සැපයීම සඳහා නව ක්‍රම සැළසුම් කිරීම, ක්ෂේත්‍ර පරීක්ෂණයට ලක් කිරීම හා සකස් කිරීම | හමු වූ පුද්ගලයන් සංඛ්‍යාව | වසර 4 පසු ආරම්භ කිරීම | [illegible] |
| 3 | උපදේශනය හා පෙළඹවීම ඇතුළු කණ්ඩායම් සැදීම නියෝජනය හා සහභාගීත්වය | 3.1 තම සම වයස් කණ්ඩායම් නියෝජනය කිරීම සඳහා තීරණ ගැනීමේ හැකියාවෙන් යුත් ඵලදායි කණ්ඩායම් පිහිටුවීම. එසේම සමාජ හා සංවර්ධන ප්‍රධාන ධාරාවේ සමාන ලෙස සහභාගිවීම හා සාධාරණ ලෙස අන්තර්කරණය කරනු ලැබීම සඳහා තම අයිතිය කියාපෑම | 3.1a ආබාධ සහිත තැනැත්තන්ගේ ස්වයං උපකාර කණ්ඩායම්, ආබාධ සහිත තැනැත්තන්ගේ සංවිධාන හා දෙමාපිය කණ්ඩායම් පිහිටුවීම හා සංවිධානය කිරීම ප්‍රවර්ධනය කිරීම හා උපකාර කිරීම | පහළ මට්ටමේ ප්‍රජා මූලික පුනරුත්ථාපනය සමග අන්‍යෝන්‍ය වශයෙන් කටයුතු කරන ආබාධ සහිත තැනැත්තන්ගේ සංවිධාන හා දෙමාපිය කණ්ඩායම් සංඛ්‍යාව | කෙරීගෙන යන | [illegible] |
| | | | 3.1b ඔවුන්ගේ දැනුම වැඩිකර ගැනීමේ හා උපදේශන හා පෙළඹවීමේ නිපුණතාවන් ප්‍රවර්ධනය කිරීම හා සහාය වීම | ප්‍රාදේශීය හා ඉහළ මට්ටමින් ඉලක්ක කරගෙන ඇති ආබාධ සහිත තැනැත්තන්ගේ සංවිධාන | වසර 1+ පසු ආරම්භ කිරීම | [illegible] |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | හා දෙමාපිය කණ්ඩායම් සංඛ්‍යාව | | |
| | | | 3.1c සමානතාව පදනම් කරගෙන ආබාධ සහිත ළමුන් ළමා සමාජ / සංවිධානවලට අන්තර්කරණය කර ගැනීම ප්‍රවර්ධනය කිරීම හා පහසුකම් සැලසීම | ළමා සමාජ /සංවිධානවල සාමාජිකයන් වන ආබාධ සහිත ළමුන් සංඛ්‍යාව<br>තනතුරු දරන්නන් වන ආබාධ සහිත ළමුන් සංඛ්‍යාව | මාස 6 + ඇතුළත | |
| 4 | සන්නිවේදන හා තොරතුරු | 4.1 (1) ආබාධ සහිත තැනැත්තන්ගේ සන්නිවේදන අවශ්‍යතා ඉටු කිරීම<br><br>4.1 (ii) සියලු වර්ගවල ආබාධ සහිත තැනැත්තන්ට ප්‍රවෘත්ති, තත්කාලීන සිදුවීම් තොරතුරු හා සාහිත්‍යය හා කැමති පොත් ඇතුළු කියවීම් ද්‍රව්‍ය | 4.1a බිහිරි තැනැත්තන්ගේ භාෂාව වශයෙන් සංඥා භාෂාව පිළිගැනීම | සංඥා භාෂාව පිළිගැනීම | වසර 1 ඇතුළත | සමාජ සේවා අමාත්‍යාංශය |
| | | | 4.b සංඥා භාෂාව සහ පරිවර්තනය ඇතුළු සංඥා භාෂා සේවාවන් ව්‍යාප්ත කිරීම | සංඥා භාෂාව භාවිත කරන පොදු සංසඳ සංඛ්‍යාව | වසර 1 + පසු ආරම්භ කිරීම | සමාජ සේවා අමාත්‍යාංශය |
| | | | 4.1c සංඥා භාෂා පරිවර්තකයන් සඳහා පුහුණු වැඩසටහන් සකස් කිරීම, අනුමත කිරීම හා ක්‍රියාත්මක කිරීම | අනුමත කළ පුහුණු වැඩසටහන් සංඛ්‍යාව | වසර 2 + පසු ආරම්භ කිරීම | සමාජ සේවා අමාත්‍යාංශය |
| | | | 4.1d අනුමත සංඥා භාෂා පරිවර්තකයන් ලියාපදිංචි කිරීම සඳහා උපමාන ස්ථාපිත කිරීම හා ඔවුන් පිළිබඳ ලේඛන පවත්වාගෙන යාම | ලියාපදිංචි කරන ලද සංඥා භාෂා පරිවර්තකයන් සංඛ්‍යාව | වසර 2 ඇතුළත | සමාජ සේවා අමාත්‍යාංශය, පළාත් සභා |
| | | | 4.1e වැදගත් වන ප්‍රවෘත්ති හා තොරතුරු ප්‍රවේශ විය හැකි ආකෘතිවල හා මුද්‍රිත හා දෘශ්‍ය මාධ්‍යවල (බ්‍රේල්, විශාල මුද්‍රණ, පහසුවෙන් කියවිය හැකි ආකෘති, සංඥා භාෂාව, කථා පරිවර්තනය, සංඥා භාෂා, දෘෂ්‍ය මාධ්‍ය යනාදිය) සකස් කිරීම | ප්‍රවේශ විය හැකි ආකෘතිවල ඇති ලේඛන ද්‍රව්‍ය සංඛ්‍යාව<br>සංඥා භාෂාවලින් වැඩසටහන් ඉදිරිපත් කරන රූපවාහිනී නාලිකා සංඛ්‍යාව | ආරම්භය වසර 1+ පසු | සමාජ සේවා අමාත්‍යාංශය |
| | | | 4.1f ශ්‍රව්‍ය හා බ්‍රේල් ලේඛන පිටපත් කිරීම හා නිෂ්පාදනය කිරීම ව්‍යාප්ත කිරීම | ලබා ගත හැකි බ්‍රේල් හා ශ්‍රව්‍ය ද්‍රව්‍ය සංඛ්‍යාව | වසර 3 ඇතුළත | සමාජ සේවා අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය, ආබාධ සහිත පුද්ගලයන්ගේ සංවිධාන |
| | | | 4.1g වර්ධනීය හා විකල්ප සන්නිවේදන ක්‍රම භාවිත කිරීම හා ලබා ගත හැකිවීම දියුණු කිරීම | වර්ධනීය හා විකල්ප සන්නිවේදන ක්‍රම භාවිත කරන පුද්ගලයන් සංඛ්‍යාව | වසර 3 ඇතුළත | සෞඛ්‍ය අමාත්‍යාංශය |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | 4.1h ස්පර්ශක සංඥා භාෂාව භාවිත කිරීම හා ලබා ගත හැකි වීම වර්ධනය කිරීම | ස්පර්ශක සංඥා භාෂාව භාවිත කරන පුද්ගලයන් සංඛ්‍යාව | | සමාජ සේවා අමාත්‍යාංශය |
| 5 | දේශපාලන අයිතිවාසිකම් | 5.1 ආබාධ සහිත තැනැත්තන්ගේ දේශපාලන අයිතිවාසිකම් ඉටු කිරීම | 5.1a අවශ්‍ය සහය හා උපකාරය ලබා දීම සඳහා පුහුණු කාර්ය මණ්ඩලයක් සැපයීම හා ප්‍රවේශ විය හැකි ආකෘතිවල (නිද: බ්‍රේල්) මැතිවරණ ලේඛණ ඉදිරිපත් කරමින් ඡන්ද මධ්‍යස්ථාන ප්‍රවේශ විය හැකි ඒවා බවට පත් කිරීම | ප්‍රවේශ විය හැකි ඡන්ද මධ්‍යස්ථාන ප්‍රතිශතය<br>පුහුණු කරන ලද කාර්ය මණ්ඩලයේ ප්‍රතිශතය<br>විශේෂ පෝලිම් සහිත ඡන්ද මධ්‍යස්ථාන සංඛ්‍යාව<br>මැතිවරණ ලේඛන බ්‍රේල් භාෂාවෙන් | ආරම්භය වසර 1+ පසු | මැතිවරණ දෙපා. |
| 6 | නෛතික රැකවරණය | 6.1 යුක්තිය සඳහා සාධාරණ ප්‍රවේශය | 6.1a යුක්ති ක්‍රමය කරා ප්‍රවේශ වීමේ දී මුහුණ පාන බාධක සමාලෝචනය කිරීම සහ අධිකරණ යුක්තිය කරා ළඟා වීමට හැකියාව ලබා දීම සඳහා පියවර නිර්දේශ කිරීම | සමාලෝචනය සම්පූර්ණ කිරීම හා නිර්දේශ ඉදිරිපත් කිරීම | වසර 1 ඇතුළත | අධිකරණ අමාත්‍යාංශය |
| | | | 6.1b නිර්දේශ ක්‍රියාත්මක කිරීම | නීති ආධාර ලබා ගත්තා පුද්ගලයන් සංඛ්‍යාව<br>සංඥා භාෂා පරිවර්තන සපයන අධිකරණ සංඛ්‍යාව | ආරම්භය වසර 1 + පසු | |
| | | 6.2 සියලු නීති හා රෙගුලාසි ආබාධ සහිත පුද්ගලයන්ගේ මානව අයිතිවාසිකම්වලට අනුකූල වන බව | 6.2a පවත්නා නීති සමාලෝචනය කිරීම | සමාලෝචනය සම්පූර්ණ කිරීම | වසර5 ඇතුළත | සමාජ සේවා අමාත්‍යාංශය, අධිකරණ අමාත්‍යාංශය |
| | | | 6.2b ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය හා දේශීය නීති හා ජාතික ප්‍රතිපත්තියට පටහැනි දෑ සංශෝධනය කිරීම | සංශෝධනය කරන ලද නීති (සංශෝධනය අවශ්‍ය වූ) ප්‍රතිශතය | ආරම්භය වසර 5 පසු | |
| 7 | දුගීබව තුරන් කරලීම හා සමාජ ආරක්ෂණය | 7.1 (i) ආබාධ සහිත පුද්ගලයන් අතර දුගීබවේ මට්ටම් අඩු කිරීම<br><br>7.1 (ii) ආබාධ සහිත පුද්ගලයන්ට ආර්ථික සුරක්ෂිතතාව තිබීම<br><br>7.1 (iii) සහශ්‍ර සංවර්ධන ඉලක්ක අංක 1 මගින් අත්ත දුගීබව හා සාගින්න තුරන් කරලීම යටතේ ආබාධ සහිත පුද්ගලයන් සැලකිල්ලට ගැනීම | 7.1a දුගීබව තුරන් කරලීම, සමාජ ආරක්ෂණය, සමාජ ආරක්ෂක ජාල, සමාජ ආරක්ෂණය හා විශ්‍රාම වැටුප්, ඉතිරි කිරීම් හා රක්ෂණ යෝජනා ක්‍රමවල දී ආබාධ සහිත තැනැත්තන් අන්තර්කරණය කිරීම සඳහා බාධක හා යහපත් භාවිතාවන් සමාලෝචනය කිරීම පිණිස ක්‍රියාකාරී කණ්ඩායම් පත් කිරීම හා වැඩිදියුණු කිරීම් සඳහා (විශේෂයෙන්ම ඉතා දරුණු ලෙස ආබාධ සහිත තැනැත්තන් සඳහා) නිර්දේශ ඉදිරිපත් කිරීම | සමාලෝචනය අවසන් කිරීම හා නිර්දේශ ඉදිරිපත් කිරීම | වසර 1 ඇතුළත | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය, සමාජ සේවා අමාත්‍යාංශය |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | 7.1b නිර්දේශ ක්‍රියාත්මක කිරීම | දිවි නැගුමෙහි ඇතුළත් කරන ලද ප්‍රතිශතය | ආරම්භය වසර 1 පසු | |
| | | | ප්‍රතිලාභ ලැබූ දරුණු ආබාධ සහිත තැනැත්තන් සංඛ්‍යාව | | |
| | | 7.1c විශේෂ දීමනා ලබා දීම (නිද; මහින්ද චින්තනය) | 1c විශේෂ දීමනා ලැබූ සංඛ්‍යාව | කෙටි මධ්‍ය කාලීන | |
| | | 7.1d සහශ්‍ර සංවර්ධනය ඉලක්ක අංක 10 සම්බන්ධ දර්ශකවලට ආබාධිත බව අන්තර්කරණය කිරීමට පියවර ගැනීම | 1d සහශ්‍ර සංවර්ධනය ඉලක්කවල දුගීබව පිළිබඳ දර්ශකවලට ආබාධිත බව අන්තර්කරණය කිරීම | මාස 3 ඇතුළත | |

## දෙවන තේමා ක්ෂේත්‍රය: සෞඛ්‍යය හා පුනරුත්ථාපනය

සෞඛ්‍යය: "ආබාධ සහිත පුද්ගලයන්ට අනෙක් ජනයාට මෙන්ම සාමාන්‍ය සෞඛ්‍ය රැකවරණ අවශ්‍යතා සඳහා සෞඛ්‍ය සේවාවන් අවශ්‍ය වේ. සාමාන්‍ය සෞඛ්‍ය රැකවරණ අවශ්‍යතා ගණයට සෞඛ්‍ය ප්‍රවර්ධනය, වැළැක්වීමේ රැකවරණ (ප්‍රතිශක්තිකරණය සාමාන්‍ය සෞඛ්‍ය පරීක්ෂාව) උග්‍ර හා නිදන්ගත රෝගවලට ප්‍රතිකාර හා අවශ්‍ය අවස්ථාවන්හි දී වඩා විශේෂිත ප්‍රතිකාර සඳහා යෝග්‍ය යොමු කිරීම් ඇතුළත් වේ. මෙම අවශ්‍යතා මූලික සෞඛ්‍ය ප්‍රතිකාර මගින් ඉටු විය යුතු අතර අදාළ වන ආකාරයට අතිරේක වශයෙන් ද්විතියික හා තෘතියික සෞඛ්‍ය ප්‍රතිකාරවලදී ඉටු විය යුතුය".

2011 *ආබාධිත බව පිළිබඳ ගෝලීය වාර්තාව, 58 පිටුව*

පුනරුත්ථාපනය: *ගෝලීය වාර්තාව* පුනරුත්ථාපනය යන්න මෙසේ විග්‍රහ කරයි "සිය පරිසරය සමග අන්තර්ක්‍රියා කිරීමේ දී ඉතා යෝග්‍ය අයුරින් ක්‍රියාකාරිත්වය අත්කර ගැනීමට හා පවත්වාගෙන යාමට ආබාධිත බව අත්දකින හෝ අත්දැකීමට ඉඩකඩ තිබෙන පුද්ගලයන්ට උපකාර කරන ක්‍රියාමාර්ග මාලාවක්".
එය පහත සඳහන් පරිදි ද කියයි". පුනරුත්ථාපනය යන සංකල්පය පුළුල් එකක් වුව ද ආබාධිත බව සම්බන්ධ සියළු දෑ එම වදනට ඇතුළත් කළ නොහැකිය. පුනරුත්ථාපනය පුද්ගල ක්‍රියාකාරිත්වය වර්ධනය කිරීම ඉලක්ක කර ගනී. එනම් ස්වාධීනව ආහාර ගැනීම හා පානය කිරීම සඳහා පුද්ගලයෙකු සතු හැකියාව දියුණු කිරීමයි. පුද්ගලයකුගේ පරිසරයට වෙනස්කම් හඳුන්වා දීම ද පුනරුත්ථාපනයට ඇතුළත් වෙයි. නිදසුනක් වශයෙන් අත්වැලක් හඳුන්වා දීම සැලකිය හැකිය. එහෙත් පොදු ගොඩනැගිල්ලකට බෑවුම් මගක් සවි කිරීම වැනි සමාජ මට්ටමින් බාධක ඉවත් කිරීමට ගන්නා ප්‍රයත්නයන් මෙම වාර්තාවෙහි පුනරුත්ථාපනය වශයෙන් සළකනු නොලැබේ".

*ආබාධිත බව පිළිබඳ ගෝලීය වාර්තාව, 96 පිටුව*

| | කේන්ද්‍රීය ක්ෂේත්‍රය | අපේක්ෂිත ප්‍රතිඵලය | ක්‍රියාකාරකම | ප්‍රධාන කාර්ය ඉටු කිරීමේ දර්ශකය | කාල රාමුව | වගකිවයුතු ආයතන/ය |
|---|---|---|---|---|---|---|
| 1 | ප්‍රතිපත්ති, නීති හා සැළසුම් | 1.1 ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්ති, නීති හා සැළසුම් සමාලෝචනය කිරීම සහ ආබාධිත බව පිළිබඳව කටයුතු කිරීම සඳහා උපාය මාර්ග ශක්තිමත් කිරීම | 1.1a ආබාධිත බව පිළිබඳ ජාතික මෙහෙයුම් කමිටුවක් පත් කිරීම | ආබාධිත බව පිළිබඳ ජාතික මෙහෙයුම් කමිටුව පිහිටුවා ක්‍රියාත්මක වේ | කෙටි ගෙන යයි | සෞඛ්‍ය අමාත්‍යාංශය |
| | | 1.1a ඊළඟ හා පසුව සිදු කරන පුනරුත්ථාපන ප්‍රතිපත්ති හා සැලසුම් සමාලෝචනවල දී ප්‍රධාන ධාරාවට ඇතුළත් කර ගැනීම, සමාජ අන්තර්කරණය හා සහභාගිත්වය සැලකිල්ලට ගැනීම | 1.1b තරුණ, වැඩිහිටි, ආබාධ සහිත හා අවතැන් කටයුතු පිළිබඳ අධ්‍යක්ෂවරයා යටතේ ප්‍රජා වෛද්‍ය විශේෂඥවරයකුගේ නායකත්වය යටතේ ආබාධිත බව (ළමුන් ද ඇතුළුව) සම්බන්ධයෙන් අනු ඒකකයක් පිහිටුවීම | අනු කමිටුව පිහිටුවා ක්‍රියාත්මක වේ | වසර 1 ඇතුළත | |
| | | | 1.1c ප්‍රාථමික සෞඛ්‍ය රැකවරණයෙහි ප්‍රධාන අංගයක් වශයෙන් ආබාධිත බව | ප්‍රාථමික සෞඛ්‍ය රැකවරණ පැකේජයෙහි ආබාධිත බව | කෙටි ගෙනයයි | සෞඛ්‍ය අමාත්‍යාංශය |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | අන්තර්කරණය කිරීම | පිළිබඳ රූකවරණ ඇතුළත් කරනු ලැබූ සෞඛ්‍ය නිලධාරී ප්‍රදේශ සංඛ්‍යාව | | පළාත් සභා |
| | | | 1.1d ආබාධිත බව ප්‍රාථමිකව වැලැක්වීමේ කාර්යයෙහි පරතරයන් සමාලෝචනය කිරීම හා හඳුනා ගැනීම සහ ශක්තිමත් කිරීම | ශක්තිමත් කිරීම සඳහා හඳුනා ගනු ලැබූ ප්‍රාථමිකව වැලැක්වීමේ උපාය මාර්ග සංඛ්‍යාව | වසර 3 ඇතුළත | සෞඛ්‍ය අමාත්‍යාංශය |
| 2 | වෛද්‍ය හා සෞඛ්‍ය රූකවරණ නිලධාරීන් | 2.1 ආබාධ සහිත පුද්ගලයන්ගේ හා ඔවුන්ගේ පවුල්වල අයිතිවාසිකම්, තත්ත්වය, සන්නිවේදන හා වෙනත් අවශ්‍යතා පිළිබඳව වෛද්‍ය හා සෞඛ්‍ය රූකවරණ සලසන්නන් සංවේදී වීම | 2.1a සෞඛ්‍ය රූකවරණ අවශ්‍යතා ඵලදායී ලෙස කළමනාකරණය කිරීම ප්‍රවර්ධනය කිරීම පිණිස සෞඛ්‍ය විෂය මාලාවට ආබාධිත බව පිළිබඳ මොඩියුල හඳුන්වා දීම /සමාලෝචන කිරීම හා සංශෝධනය කිරීම | ආබාධිත බව අන්තර්කරණය වූ විෂයමාලා සංඛ්‍යාව<br>ආබාධිත බව ඇතුළත් සංශෝධිත විෂයමාලා සංඛ්‍යාව<br>එක් එක් විෂය මාලාවෙහි ආබාධිත බව සඳහා වෙන් කර ඇති කාලයෙහි ප්‍රතිශතය | කෙටි ගෙන යයි | සෞඛ්‍ය අමාත්‍යාංශය |
| | | 2.2 පුනරුත්ථාපනයෙහි නිරත පුනරුත්ථාපන නිලධාරීන් හා අනෙක් නිලධාරීන්ට අඛණ්ඩ වෘත්තීය හා වෘත්තීය සංවර්ධනය සහිත ගුණාත්මක මූලික හා අඛණ්ඩ අධ්‍යාපනයක් තිබීම | 2.2a ආබාධ සහිත පුද්ගලයන් පිළිබඳ රූකවරණය සඳහා වූ ජාතික මෙහෙයුම් කමිටුව විසින් පහත සඳහන් දෑ තක්සේරු කළ යුතුය.<br>(1) ආබාධිත බව සම්බන්ධ යෝග්‍යතම සෞඛ්‍ය රූකවරණය හා පුනරුත්ථාපන කාර්යයන් ඉටු කිරීම සඳහා දැනට සිටින නිලධාරී පිරිසගේ අවශ්‍යතා<br>(2) පුනරුත්ථාපන නිලධාරීන්ගේ හා පුනරුත්ථාපනයෙහි නියැළී සිටින අනෙක් නිලධාරීන්ගේ මූලික හා අඛණ්ඩ අධ්‍යාපන විෂය මාලාව සමාලෝචනය කිරීම හා සංශෝධනය කිරීම,<br>(3) අලුතෙන් අවශ්‍ය සේවක වර්ග හා සේවක සංඛ්‍යා, ඔවුන්ගේ පුහුණු අවශ්‍යතා තිරණය කර එකී පුහුණුව සැලසීම හා පහසුකම් සැලසීම (මනෝවිද්‍යාඥයන්, වෛද්‍ය සමාජ සේවකයන්, ප්‍රජා හෙදියන්, මානසික සෞඛ්‍ය හෙදියන්)<br>(4) අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය හා රූකියා සංවර්ධනය සඳහා උපාය මාර්ග ස්ථාපිත කිරීම | පහත සඳහන් නිලධාරීන්ගේ සේවක සංඛ්‍යා, මූලික විෂය මාලා සහ අඛණ්ඩ අධ්‍යාපනය, අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය සහ රූකියා සංවර්ධනය<br>භෞත චිකිත්සකයන්<br>වෘත්තීය චිකිත්සකයන්<br>කථන හා භාෂා චිකිත්සකයන්<br>අංගාදේශකවරුන් හා සෘජුකාරකයන්<br>අනෙකුත් නිලධාරීන් | වසර 4 ඇතුළත | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | 2.2b ඉහත කොටස්වල අධ්‍යාපනික සුදුසුකම් ඇතුළුව බඳවාගැනීමේ උපමාන කාලයෙන් කාලයට සමාලෝචනය කොට සංශෝධනය කිරීම | සංශෝධනය කරන ලද බඳවාගැනීමේ උපමාන ප්‍රතිශතය | වසර 5 ඇතුළත | |
| 3 | විශේෂඥ සේවාවන්ට ප්‍රවේශය | 3.1 ආබාධ සහිත පුද්ගලයන්ට අවශ්‍ය විශේෂඥ සේවාවන් ලබාගත හැකි වීම | 3.1a රක්තවාදවේදය හා පුනරුත්ථාපන විශේෂඥයන්, විශේෂඥ හෙද පුහුණුව, භෞතචිකිත්සකවේදය, වෘත්තීය චිකිත්සාව, කථන හා භාෂා චිකිත්සාව සහ සමාජ වැඩ සහිතව අදියරෙන් අදියර කෙටි හා මධ්‍ය කාලීන රැකවරණය සඳහා සියලු ශික්ෂණ, පළාත් හා දිසා මහ රෝහල්වල පුනරුත්ථාපන ඒකක පිහිටුවීම | පුනරුත්ථාපන ඒකක සහිත ශික්ෂණ හා පළාත් රෝහල්වල ප්‍රතිශතය<br>පුරප්පාඩු පුරවන ලද කාර්ය මණ්ඩල සංඛ්‍යා ප්‍රතිශතය | නියමු 2 ක් වසර 3 ක් ඇතුළත පිහිටුවීම | සෞඛ්‍ය අමාත්‍යාංශය, පළාත් සභා |
| | | | 3.1b ඉහත කරුණුවලට සම්බන්ධිත ආබාධිත බව පිළිබඳ වෛද්‍ය නිලධාරින් මූලික රෝහල්වලට අදියරෙන් අදියර පත් කිරීම | ආබාධිතබව පිළිබඳ වෛද්‍ය නිලධාරින් සිටින මූලික රෝහල්වල ප්‍රතිශතය | වසර 5 ඇතුළත | |
| | | | 3.1c එක් පළාතකට එක් රෝහලක් වශයෙන් ආරම්භ කරමින් එක් එක් දිස්ත්‍රික්කය තුළ දිගු කාලීන රැකවරණය සඳහා කැපවූ පුනරුත්ථාපන රෝහල් අදියර ආකාරයෙන් පිහිටුවීම | පුනරුත්ථාපන රෝහල් ඇති දිස්ත්‍රික්ක සංඛ්‍යාව | වසර 5 ඇතුළත | |
| | | | 3.1d එක් එක් වෛද්‍ය නිලධාරී කොට්ඨාශ තුළ ආබාධිත බව සම්බන්ධ කටයුතු සඳහා අතිරේක වෛද්‍ය නිලධාරින් අදියරෙන් අදියර පත් කිරීම | අතිරේක වෛද්‍ය නිලධාරන් සිටින වෛද්‍ය නිලධාරි කොට්ඨාශ සංඛ්‍යාව | වසර 10 ඇතුළත | |
| | | | 3.1e එක් එක් දිස්ත්‍රික්කය සඳහා අදියරෙන් අදියර ප්‍රජා ළමා රෝග විශේෂඥයින් පත් කිරීම | ප්‍රජා ළමා රෝග විශේෂඥයින් සිටින දිස්ත්‍රික්ක සංඛ්‍යාව | වසර 10 ඇතුළත | |
| | | | 3.1f පුනරුත්ථාපන රෝහල්වල විරාම රැකවරණය (respite care) සඳහා පහසුකම් ඇති කිරීම | එක් එක් දිස්ත්‍රික්කය තුළ විරාම රැකවරණ පහසුකම් ඇති දිස්ත්‍රික්ක සංඛ්‍යාව | වසර 10 ඇතුළත | |
| | | | 3.1g රාගම පුනරුත්ථාපන රෝහල ළමුන් හා වැඩිහිටියන් සඳහා විශිෂ්ට ජාතික මධ්‍යස්ථානයක් වශයෙන් සැලසුම්කොට දියුණු කිරීම සඳහා | සැලසුම් සකස් කිරීම | වසර 1 ඇතුළත | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | ක්‍රියාකාරී කණ්ඩායමක් පත් කිරීම | | | |
| | | | 3.1h ක්‍රියාවන් ක්‍රියාත්මක කිරීම | කරගෙන යනු ලැබූ ක්‍රියාවන්හි ප්‍රතිශතය | වසර 3 ඇතුළත | |
| | | | 3.2a ආබාධ සහිත පුද්ගලයන්ට සියලු සායන හා සේවාවන් සඳහා විශේෂ ප්‍රවේශ පහසුකම් ලබා දෙමින් හමුවිය හැකි වේලාවන් ලබා දීමේ ක්‍රමයක් සඳහා වැඩපිළිවෙලක් සැකසීම | විශේෂ ප්‍රවේශ පහසුකම් සහිත හමුවිය හැකි වේලාවන් වෙන් කිරීමේ ක්‍රමය ක්‍රියාත්මක වන සෞඛ්‍ය පසුතල සංඛ්‍යාව | වසර 2 ඇතුළත | සෞඛ්‍ය අමාත්‍යාංශය, පළාත් සභා |
| 4 | සෞඛ්‍ය රැකවරණ පහසුකම්වලට ප්‍රවේශය | 4.1 ගොඩනැගිලිවලට, ඉඩකඩ හා උපකරණවලට ප්‍රවේශය තිබීම හා ලබා ගත හැකි වීම | 4.1a සාර්ව සැලැස්ම (universal design) පදනම් කරගෙන සෞඛ්‍ය පසුතලයන් යටතේ ආබාධ සහිත තැනැත්තන් විසින් භාවිත කරනු ලබන උපකරණ සැපයීම හා ව්‍යුහමය වෙනස්කම් සිදු කිරීම | ප්‍රවේශය ලැබිය හැකි සෞඛ්‍ය රැකවරණ පසුතලවල සංඛ්‍යාව | වසර 5 ඇතුළත | සෞඛ්‍ය අමාත්‍යාංශය, පළාත් සභා |
| | | 4.2 සෞඛ්‍ය තොරතුරු ලේඛනවලට ප්‍රවේශය ලැබිය හැකි වීම හා ලබාගත හැකි වීම | 4.2 a සෞඛ්‍ය තොරතුරු විකල්ප ආකෘතිවල ( විශාල අකුරු, බ්‍රේල්, ශ්‍රව්‍ය, සංඥා භාෂා වීඩියෝ, පහසුවෙන් කියවිය හැකි හා චිත්‍ර ආකෘතිය) ඉදිරිපත් කිරීම | ප්‍රවේශ විය හැකි ආකෘතිවල ඉදිරිපත් කර ඇති සෞඛ්‍ය තොරතුරු ලේඛන | වසර 5 ඇතුළත | සෞඛ්‍ය අමාත්‍යාංශය, ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශය |
| 5 | පූර්ව හඳුනාගැනීම හා මැදිහත්වීම | 5.1 (1) ආබාධ සහිත හා අවදානමට ලක් වූ බිළිඳුන් හා කුඩා දරුවන් මුල් කාලයේ දීම හඳුනාගැනීම<br><br>5.1 (2) හඳුනාගනු ලැබූ සියලු ළමුන් සම්බන්ධයෙන් මුල් කාලයේ දීම නිවසේ දී හා යොමු කිරීම් මගින් මැදිහත්වීම් සිදු කිරීම | 5.1a මාතෘ හා ළමා සෞඛ්‍යය යටතේ ආබාධ සහිත හා අවදානමට ලක් වූ කුඩා දරුවන් හඳුනාගැනීම හා මුල් කාලයේ දීම මැදිහත්වීම අඛණ්ඩව කරගෙන යාම දියුණු කිරීම /පුළුල් කිරීම | එක් එක් දිස්ත්‍රික්කයේ<br>පුහුණු කරන ලද මාතෘ හා ළමා සෞඛ්‍යය සේවකයන්ගේ ප්‍රතිශතය<br>හඳුනාගනු ලැබූ ළමුන් සංඛ්‍යාව<br>යොමු කිරීම් අවශ්‍ය ළමුන්ගේ ප්‍රතිශතය | වසර 5 ඇතුළත | සෞඛ්‍ය අමාත්‍යාංශය |
| | | | 5.1b යොමු කිරීමේ වැඩසටහන් එක් එක් දිස්ත්‍රික්කයේ අඛණ්ඩව කරගෙන යාම දියුණු කිරීම /පුළුල් කිරීම | යොමු කිරීමේ පහසුකම් ඇති දිස්ත්‍රික්ක සංඛ්‍යාව<br>එක් එක් දිස්ත්‍රික්කයේ යොමු කිරීම් කරනු ලැබූ ළමුන් සංඛ්‍යාව | වසර 5 ඇතුළත | |
| 6 | මානසික සෞඛ්‍ය අවශ්‍යතා | 6.1 දැඩි, මධ්‍යම හා පුනරුත්ථාපනය කළ හැකි රැකවරණ හා විශේෂඥ සේවා ශක්තිමත් කිරීම හා ප්‍රවේශ විය හැකි වීම | 6.1a මානසික සෞඛ්‍ය ඒකක පිහිටුවීම, ඒවායේ කාර්ය මණ්ඩලවලට මානසික සෞඛ්‍ය රැකවරණය පිළිබඳ පුහුණුව ලබා දීම සහ මනෝචිකිත්සකයන් හා මානසික සෞඛ්‍යය පිළිබඳ වෛද්‍යවරුන් පත් කිරීම මගින් දිස්ත්‍රික් මානසික | පහත සඳහන් ඒවායින් සමන්විත දිස්ත්‍රික්ක සංඛ්‍යාව<br>මානසික සෞඛ්‍ය ඒකක<br>පුහුණු කරන ලද කාර්ය මණ්ඩල<br>මනෝචිකිත්සකයන් | වසර 3 ඇතුළත | සෞඛ්‍ය අමාත්‍යාංශය |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | සෞඛ්‍ය රූකවරණය පුළුල් කිරීම හා දියුණු කිරීම අඛණ්ඩව කරගෙන යාම | මානසික සෞඛ්‍යය පිළිබඳ වෛද්‍යවරුන් | | |
| 7 | ශ්‍රවණ ආබාධය හා බිහිරිබව | 7.1 ශ්‍රවණ අහිමිවීම වැළැක්වීම සහ පූර්ව හඳුනා ගැනීම හා එළදායී කළමනාකරණය සඳහා ප්‍රජාවගේ දැනුම වර්ධනය කිරීම සහ යටිතල පහසුකම් හා මානව සම්පත් දියුණු කිරීම | 7.1a සැළසුම් කරන ලද ශ්‍රවණාබාධ හා බිහිරිබව වැළැක්වීමේ ජාතික වැඩසටහන ක්‍රියාත්මක කිරීම | පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව<br>පුහුණු කරන ලද නිලධාරීන් සංඛ්‍යාව<br>හමු වූ පුද්ගලයන් සංඛ්‍යාව | වසර 5 ඇතුළත | සෞඛ්‍ය අමාත්‍යාංශය |
| 8 | දෘෂ්‍ය ආබාධය හා අන්ධභාවය | 8.1 වැළැක්විය හැකි අන්ධභාවය අඩු කිරීම සහ මූලික සෞඛ්‍ය රූකවරණයට මූලික අක්ෂි රූකවරණය අන්තර්ගත කිරීමෙන් ප්‍රධාන සෞඛ්‍ය තත්ත්වයන් පාලනය කිරීම හා කළමනාකරණය කිරීම සඳහා යටිතල පහසුකම් (උපකරණ ඇතුළුව) සහ මානව සම්පත් දියුණු කිරීම | 8.1a වැළැක්විය හැකි අන්ධභාවය වැළැක්වීම හා පාලනය කිරීම පිළිබඳව සැළසුම් කළ ජාතික වැඩසටහන ක්‍රියාත්මක කිරීම | ඇසේ සුද නිසා වැළැක්විය හැකි අන්ධභාවය පැතිරීම අඩු කිරීම<br>අක්ෂි රූකවරණය පිළිබඳ පුහුණුව ලැබූ නිලධාරීන් සංඛ්‍යාව<br>අවශ්‍ය උපකරණ ලැබූ අඩු පෙනීමක් ඇති පුද්ගලයන් සංඛ්‍යාව<br>අක්ෂි රූකවරණ වැඩසටහන් මූලික සෞඛ්‍ය රූකවරණයට අන්තර්ගත කර ඇති දිස්ත්‍රික්ක ගණන<br>දිස්ත්‍රික් අක්ෂි වැඩසටහන් මගින් සේවාව ලබන පුද්ගලයන් සංඛ්‍යාව | වසර 5 ඇතුළත | සෞඛ්‍ය අමාත්‍යාංශය |
| 9 | ශාරීරික ආබාධිත බව, බුද්ධිමය ආබාධිත බව සහ වෙනත් වර්ධනාත්මක ආබාධිතභාවයන් හා චර්යා ගැටළු | 9.1 උපතින්ම ලද ආබාධ තත්ත්වයන් සහ බෝ නොවන හා නිදන්ගත තත්ත්වයන් හා කම්පන හා තුවාල ඇතුළු ශාරීරික ආබාධ සහිත ජනයාගේ; බුද්ධිමය ආබාධ සහ බහුවිධ හා දරුණු ආබාධ සහිත ජනයාගේ; සහ සංඛ්‍යාත්මක වශයෙන් වැඩිවෙමින් පවතින වර්ධනාත්මක ආබාධ ( නිද-ඔටිසම් හා මස්තිෂ්ක පක්ෂාඝාතය සහිත) ළමුන් හා තරුණ පුද්ගලයන්ගේ සහ | 9.1a ආබාධ සහිත පුද්ගලයන්ගේ රූකවරණය සඳහා වූ ජාතික මෙහෙයුම් කමිටුව විසින් තත්ත්වය සහ අවශ්‍යතා (සෞඛ්‍ය හා පුනරුත්ථාපනය හා ප්‍රජාව අතර ජීවත්වීම ඇතුළුව) තක්සේරුකොට හා සමාලෝචනයකොට ශාරීරික ආබාධ, බුද්ධිමය ආබාධ සහ බහුවිධ හා දරුණු ආබාධ, වෙනත් වර්ධනාත්මක ආබාධ සහිත ළමුන් තරුණ පුද්ගලයන් හා වැඩිහිටියන් සහ චර්යා ගැටළු ඇති ළමුන් සඳහා පියවර නිර්දේශ කිරීම | සමාලෝචනය සම්පූර්ණ කිරීම හා නිර්දේශ ඉදිරිපත් කිරීම | | සෞඛ්‍ය අමාත්‍යාංශය |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | වර්යා ගැටළු ඇති ළමුන්ගේ සෞඛ්‍ය හා පුනරුත්ථාපන අවශ්‍යතාවන් තක්සේරුකොට සැළසුම් සකස්කොට එම අවශ්‍යතාවන් ඉටු කිරීම නියා ඔවුනට දියුණු වූ ගුණාත්මක ජීවිතයක් ගුත්ති විඳීමේ හැකියාවක් ලැබීම | 9.1b නිර්දේශ ක්‍රියාත්මක කිරීම | ක්‍රියාත්මක කරන ලද නිර්දේශවල ප්‍රතිශතය | | |
| 10 | ආධාරක තාක්ෂණ හා උපකරණ | 10.1 ආබාධ සහිත තැනැත්තන්ට සිය අධ්‍යාපනය, වැඩ සහ සිය ප්‍රජාව තුළ ස්වාධීන ජීවිකාව සඳහා අවශ්‍ය යෝග්‍ය ආධාරක තාක්ෂණ හා උපකරණ ලබාගත හැකි වීම හා ඒවාට ප්‍රවේශය තිබීම | 10.1a යෝග්‍ය අඩු පිරිවැය ආධාරක උපකරණ සැපයීම පිළිබඳ මාර්ගෝපදේශ සැකසීම, අවශ්‍යතා සමාලෝචනය කිරීම හා තක්සේරු කිරීම සඳහා ක්‍රියාකාරී කණ්ඩායමක් පත් කිරීම සහ නිර්දේශිත පියවර ක්‍රියාත්මක කිරීම | වාර්තාව ලබා ගත හැකි වන අතර නිර්දේශ ඉදිරිපත් කර තිබීම | | සෞඛ්‍ය අමාත්‍යාංශය |
| | | | | මාර්ගෝපදේශ භාවිතයෙහි යෙදේ | | |
| | | | 10.1b නිෂ්පාදකයින් හා නිෂ්පාදන ලියාපදිංචි කිරීම සඳහා උපමාන සකස් කිරීම හා නිෂ්පාදකයන්ගේ හා නිෂ්පාදනවල ලේඛන පවත්වාගෙන යාම | නිෂ්පාදකයින්ගේ සංඛ්‍යාව | | |
| | | | | නිෂ්පාදන සංඛ්‍යාව | | |
| | | | 10.1 c ජාතික මට්ටමින් හා විමධ්‍යගත මට්ටමින් තිරසාර නිෂ්පාදන හා බෙදාහැරීමක් සහිතව නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා රජයේ පෞද්ගලික අංශයේ සහයෝගිතාව ප්‍රවර්ධනය කිරීම | සහයෝගිතා සංඛ්‍යාව | | සෞඛ්‍ය අමාත්‍යාංශය, සමාජ සේවා අමාත්‍යාංශය |
| | | 10.2 යෝග්‍ය ආධාරක තාක්ෂණ හා උපකරණ පිළිබඳ තොරතුරු ලබාගත හැකිවීම හා ඒවාට ප්‍රවේශය ලැබිය හැකි බව | 10.2a නිෂ්පාදකයන්ගේ හා බෙදාහරින්නන්ගේ නාමාවලියක් සකස් කිරීම, ප්‍රකාශයට පත් කිරීම හා බෙදා හැරීම | නාමාවලිය ප්‍රකාශයට පත් කිරීම හා බෙදා හැරීම | | සෞඛ්‍ය අමාත්‍යාංශය, සමාජ සේවා අමාත්‍යාංශය, ආබාධ සහිත පුද්ගලයන්ගේ සංවිධාන |
| 11 | පිරිවැය හා දැරිය හැකි බව | 11.1 පිරිවැයෙහි අඛණ්ඩ දියුණු කිරීම හා භාවිත කරන්නන්ට හා සපයන්නන්ට දැරිය හැකි බව | 11.1a නිර්දේශ ක්‍රියාත්මක කිරීම සහිතව භාණ්ඩ හා සේවාවන්හි පිරිවැය තක්සේරු කිරීම හා සමාලෝචනය කිරීම සඳහා අඛණ්ඩ ක්‍රමයක් ස්ථාපිත කිරීම පිණිස කේන්ද්‍ර ස්ථානයක් හඳුනා ගැනීම | කේන්ද්‍ර ස්ථානය ස්ථාපිත කිරීම | | සෞඛ්‍ය අමාත්‍යාංශය සමාජ සේවා අමාත්‍යාංශය |
| | | | | නිරන්තර වාර්තා | | |
| 12 | දේශීය වෛද්‍ය | 12.1 ආබාධ සහිත තැනැත්තන්ගේ සෞඛ්‍ය හා පුනරුත්ථාපන අවශ්‍යතා | 12.1a සාක්ෂි පදනම් කරගත් භාවිතාවන් සමාලෝචනය කිරීම<br>12.1b විද්‍යාත්මක භාවිතාවන් ක්‍රියාත්මක | එක් එක් දිස්ත්‍රික්කයේ ආබාධ සහිත තැනැත්තන්ට සේවය සළසන දේශීය | වසර **5** ඇතුළත | දේශීය වෛද්‍ය අමාත්‍යාංශය |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | ඵලදායී ලෙස ඉටු කරන සාක්ෂි පදනම් කරගත් භාවිතාවන් ඔවුන් වෙනුවෙන් සැපයීම අරමුණු කර ගත් ප්‍රතිපත්ති, සැලසුම් හා සේවාවන් | කිරීම ශක්තිමත් කිරීම | වෛද්‍ය පහසුකම් සංඛ්‍යාව<br>එක් එක් දිස්ත්‍රික්කයේ ප්‍රතිකාර ලැබූ ආබාධ සහිත තැනැත්තන් සංඛ්‍යාව | | |

## තෙවන තේමා ක්ෂේත්‍රය: අධ්‍යාපනය

"සැමට අධ්‍යාපනය වූකලී සියලු ළමුන්, තරුණයන් හා වැඩිහිටියන් සඳහා ගුණාත්මක මූලික අධ්‍යාපනයක් ලබා දීම සඳහා කැප වූ ගෝලීය ව්‍යාපාරයකි. ලොව පුරා රජයන් 2015 වසර වන විට සැමට අධ්‍යාපනය ඉලක්ක හයක් කරා ළඟා වීම සඳහා කැපවී සිටිති; එම ඉලක්ක නම්, මුල් ළමා විය රැකබලාගැනීම හා අධ්‍යාපනය පුළුල් කිරීම, සියලු දෙනාට නිදහස් හා අනිවාර්ය අධ්‍යාපනයක් ලබා දීම, තරුණ පුද්ගලයන් හා වැඩිහිටියන් සඳහා ඉගෙනුම් හා ජීවන නිපුණතා ප්‍රවර්ධනය කිරීම, වැඩිහිටි සාක්ෂරතාව 50% කින් වැඩි කිරීම, 2005 වන විට ස්ත්‍රී පුරුෂයන් අතර සමතාව (gender parity) ද 2015 වන විට ස්ත්‍රී පුරුෂයන් අතර සමානත්වය ද (gender equality) ළඟා කර ගැනීම සහ අධ්‍යාපනයේ ගුණාත්මක බව වැඩි කිරීම වේ.

ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තියේ 24 වන ව්‍යවස්ථාව මගින්, සියලු මට්ටම්වල දී අන්තර්කරණ අධ්‍යාපන ක්‍රමයක් සඳහා සමාන ප්‍රවේශය සහතික කරලීමේ සහ ආබාධ සහිත තැනැත්තන්ගේ අධ්‍යාපනයට පහසුකම් සැලසීම සඳහා ඔවුන්ට සාධාරණ ඉඩකඩ හා සාධාරණ අවස්ථා හා පුද්ගල ආධාරක සේවා සැපයීමේ අවශ්‍යතාව අවධාරණය කරයි"

"ළමුන් පාසල් කරා ආකර්ශණය කර ගැනීම හා සිය හැකියාවන් ඉහළම මට්ටමින් දියුණු කර ගැනීම සඳහා ඉගෙනුම් පරිසරයක වර්ධනය වීම පිණිස ඉඩකඩ සලසන ඉගෙනුම් පරිසරයක වර්ධනය වීමේ හැකියාව සහතික කිරීම ගෝලීය වශයෙන ප්‍රාථමික අධ්‍යාපනය සම්පූර්ණ කිරීමේ සහශ්‍ර සංවර්ධන ඉලක්ක මගින් අවධාරණය කරයි."
*ආබාධිත බව පිළිබඳ ගෝලීය වාර්තාව, 206 පිටුව*

*සටහන: ශ්‍රී ලංකාවේ අමාත්‍යාංශ ගණනාවක් අධ්‍යාපනයේ විවිධ අංග සම්බන්ධයෙන් වගකීම බෙදා ගනී. වර්තමානයේ මේ අමාත්‍යාංශ නම් ළමා අභිවෘද්ධි හා කාන්තා කටයුතු අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයයි. සමහර අංග පළාත් සභාවලට පවරා ඇත. ආබාධිත බව පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්මෙහි එක් එක් අංගය සඳහා වගකීම බෙදා දී ඇත්තේ එවට රජයෙන් ලැබී ඇති වරම අනුවය.*

| | කේන්ද්‍රීය ක්ෂේත්‍රය/ ආමන්ත්‍රණය කරන ලද කරුණු | අපේක්ෂිත ප්‍රතිඵලය | ක්‍රියාකාරකම | ප්‍රධාන කාර්ය ඉටු කිරීමේ දර්ශකය | කාල රාමුව | වගකිවයුතු ආයතන/ය |
|---|---|---|---|---|---|---|
| 1 | ප්‍රතිපත්ති, නීති, උපාය මාර්ග හා සැලසුම් | 1.1 ආබාධිත බව සැලකිල්ලට ගැනීම සඳහා අධ්‍යාපන ප්‍රතිපත්ති, නීති, උපාය මාර්ග | 1.1a අධ්‍යාපන ප්‍රතිපත්ති, නීති, උපාය මාර්ග හා සැලසුම් (විභාගවල දී විශේෂ පහසුකම් හා සන්නිවේදන ක්‍රම සැපයීම | පාසල් ක්‍රමය අන්තර්කරණය වී තිබීම<br>නීති අන්තර්කරණය වී තිබීම | වසර 4 + ඇතුළත | අධ්‍යාපන අමාත්‍යාංශය පළාත් සභා |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | හා සැලසුම් සමාලෝචනය කිරීම සහ සංශෝධනය කිරීම | ඇතුළුව ) පිළිබඳ ඊළඟ සමාලෝචනයට ආබාධ සහිත ළමුන් පූර්ණ වශයෙන් අන්තර්කරණය කිරීම | වාර්තා උපාය මාර්ග සහ සැලසුම් අන්තර්කරණය වී තිබීම | (+ = කෙරී ගෙන යන) | |
| 2 | මධ්‍යස්ථානය පදනම් කරගත් මූල් ළමාවිය අධ්‍යාපනය | 2.1 (1) මූල් ළමාවිය රැකවරණ හා සංවර්ධන මධ්‍යස්ථානවල සිටින ආබාධ සහිත ළමුන්ට ගුණාත්මක මූල් ළමාවිය අධ්‍යාපනයක් ලැබීම<br><br>2.1 (2) ආබාධ සහිත ළමුන් ලියාපදිංචි කිරීම වැඩි කිරීම | 2.1a මූල් ළමාවිය රැකවරණ හා සංවර්ධන මධ්‍යස්ථාන පිළිබඳ ජාතික කමිටුව විසින් පූර්ව ප්‍රාථමික අධ්‍යාපනය ලබා ගත හැකිවීමේ හා ප්‍රවේශය ලැබීමේ හා එය ආබාධ සහිත ළමුන් සඳහා අන්තර්කරණය කිරීමේ දුර්වලතා හඳුනාගෙන නිර්දේශ ඉදිරිපත් කිරීම | වාර්තාව සම්පූර්ණ කිරීම | මාස 6 ඇතුළත | මූල් ළමාවිය රැකවරණ හා සංවර්ධන මධ්‍යස්ථාන පිළිබඳ ජාතික කමිටුව |
| | | | 2.1b නිර්දේශ ක්‍රියාත්මක කිරීම | ක්‍රියාත්මක කරන ලද නිර්දේශවල ප්‍රතිශතය | ආරම්භය මාස 6 + පසු කෙරීගෙන යන | ළමා අභිවෘද්ධි හා කාන්තා කටයුතු අමාත්‍යාංශය |
| | | | 2.1c ආබාධිත බව අන්තර්කරණය කර ඇති බව පෙන්වීම සඳහා මූල් ළමාවිය රැකවරණ හා සංවර්ධන මධ්‍යස්ථාන පිළිබඳ ජාතික දත්ත ගබඩාව යාවත්කාල කිරීම | ජාතික දත්ත ගබඩාවෙහි ලැයිස්තුගත කරන ලද අන්තර්කරණ මධ්‍යස්ථානවල ප්‍රතිශතය | මාස 6 ඇතුළත | ළමා අභිවෘද්ධි හා කාන්තා කටයුතු අමාත්‍යාංශය |
| | | | 2.1d මූල් ළමාවිය රැකවරණ හා සංවර්ධන මධ්‍යස්ථාන අධීක්ෂණය කිරීමේ දී ආබාධිත බව අන්තර්කරණය කිරීම | බාධක වාර්තා කරන මධ්‍යස්ථානවල ප්‍රතිශතය<br>වාර්තා කරන ලද බාධක සංඛ්‍යාව හා වර්ගය | මාස 6 ඇතුළත | ළමා අභිවෘද්ධි හා කාන්තා කටයුතු අමාත්‍යාංශය , පළාත් සභා |
| | | | 2.1e පෙර පාසල් ගුරු පුහුණුව ආබාධිත බව අන්තර්කරණය කරන හා අන්තර්ක්‍රියාකාරී එකක් බවට පත් කිරීම සඳහා එහි විෂය මාලාව සමාලෝචනය කිරීම සහ දියුණු කිරීම | ආබාධිත බව අන්තර්කරණය කිරීම සඳහා වෙන් කළ කාලයේ ප්‍රතිශතය | වසර 1 ඇතුළත | ළමා අභිවෘද්ධි හා කාන්තා කටයුතු අමාත්‍යාංශය , සෞඛ්‍ය අමාත්‍යාංශය , අධ්‍යාපන අමාත්‍යාංශය , පළාත් සභා |
| | | | 2.1f සංශෝධිත විෂය මාලාව භාවිත කරමින් පෙර පාසල් ගුරුවරුන් පුහුණු කිරීම | එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පුහුණු කරන ලද ගුරුවරුන් සංඛ්‍යාව | ආරම්භය වසර 1 + පසු | ළමා අභිවෘද්ධි හා කාන්තා කටයුතු අමාත්‍යාංශය , පළාත් සභා රාජ්‍ය නොවන සංවිධාන , |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | | පෞද්ගලික අංශය |
| | | | 2.1g මුල් ළමාවිය රැකවරණ හා සංවර්ධන ගුරුවරුන් සඳහා ආබාධිත බව අන්තර්කරණය කිරීම පිළිබඳ අත්පොත් හා ඉගැන්වීම් ද්‍රව්‍ය සකස්කොට බෙදා හැරීම | අත්පොත් හා ලේඛන ද්‍රව්‍ය සංඛ්‍යාව | ආරම්භය වසර 1+ පසු | ළමා අභිවෘද්ධි හා කාන්තා කටයුතු අමාත්‍යාංශය |
| | | | 2.1h නිවස පදනම් කර ගත් වැඩසටහන් හා මුල් ළමාවිය රැකවරණ හා සංවර්ධන මධ්‍යස්ථානවල කළමණාකරුවන් හා ගුරුවරුන් මාර්ගයෙන් ආබාධ සහිත ළමුන් ලියාපදිංචි කිරීම සඳහා දෙමාපියන් පෙළඹවීම හා ඔවුන්ට උපදෙස් දීම | එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ලියාපදිංචි කරන ලද ළමුන්ගේ ප්‍රතිශතය | ආරම්භය වසර 1+ පසු | ළමා අභිවෘද්ධි හා කාන්තා කටයුතු අමාත්‍යාංශය, සමාජ සේවා අමාත්‍යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය, පළාත් සභා, රාජ්‍ය නොවන සංවිධාන, පෞද්ගලික අංශය |
| | | | 2.1i මුල් ළමාවිය රැකවරණ හා සංවර්ධන මධ්‍යස්ථාන සහ උපකරණ සියලු ළමුන්ට භාවිතය සඳහා ප්‍රවේශය ලැබිය හැකි ඒවා බවට පත් කිරීම (ගොඩනැගිලි සෙල්ලම් බඩු ඉගෙනුම් හා ක්‍රීඩා උපකරණ හා ද්‍රව්‍ය) | එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පූර්ණ වශයෙන් ප්‍රවේශ විය හැකි බවට පත් කරන ලද මුල් ළමාවිය රැකවරණ හා සංවර්ධන මධ්‍යස්ථාන සංඛ්‍යාව | ආරම්භය මාස 6 + පසු | ළමා අභිවෘද්ධි හා කාන්තා කටයුතු අමාත්‍යාංශය, පළාත් සභා, රාජ්‍ය නොවන සංවිධාන, පෞද්ගලික අංශය |
| 3 | ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපනය | 3.1 (1) ) ආබාධ සහිත ළමුන් සඳහා ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපනයේ වැඩි කරන ලද හා සාධාරණ අවස්ථා සැලසීම | 3.1a ආබාධ සහිත ළමුන් සඳහා පාසල් අධ්‍යාපනය පිළිබඳ සියලු අංශ දියුණු කිරීම පිළිබඳව උපදෙස් දීම පිණිස ක්‍රියාකාරී මණ්ඩලයක් බවට පත් කිරීම සඳහා විශේෂ අධ්‍යාපන උපදේශක කමිටුව නැවත සකස් කිරීම | උපදේශක මණ්ඩලය | වත්මන් මණ්ඩලය අවසන් වීමෙන් පසු | අධ්‍යාපන අමාත්‍යාංශය |
| | | | 3.1b ආබාධ සහිත ළමුන් ප්‍රාථමික හා ද්විතියික මට්ටම්වලදී වැඩි වශයෙන් අධ්‍යාපනයෙන් ගිලිහී යාමට හේතු | තිර්දේශ සහිත වාර්තාව ලබාගත හැකි වීම | මාස 6 ඇතුලත | අධ්‍යාපන අමාත්‍යාංශය, ආර්ථික සංවර්ධන |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | තීරණය කිරීම සඳහා අධ්‍යයනයක් කිරීම පිණිස ක්‍රියාකාරී කණ්ඩායමක් පත් කිරීම සහ ආබාධ සහිත ළමුන් අධ්‍යාපනය නිම කරන බව සහතික කරලීම සඳහා පියවර නිර්දේශ කිරීම | | | අමාත්‍යාංශය |
| | | 3.1c ක්‍රියාවන් ක්‍රියාත්මක කිරීම | ගිලිහී යාමේ අනුපාතිකය පහළ දැමීම (පාසල් සංගණනය) | වසර 2 ඇතුළත | |
| | | 3.1d පූර්ව ප්‍රාථමික අධ්‍යාපනයේ සිට ප්‍රාථමික අධ්‍යාපනය දක්වා ළමුන් සංක්‍රමණය පහසුවෙන් සිදුවන බව සහතික කරලීම සඳහා පියවර ගැනීම | පූර්ව ප්‍රාථමික අධ්‍යාපනයේ සිට ප්‍රාථමික අධ්‍යාපනය දක්වා සංක්‍රමණය වන ළමුන්ගේ ප්‍රතිශතය | මාස 3 ඇතුළත | අධ්‍යාපන අමාත්‍යාංශය, ළමා අභිවෘද්ධි හා කාන්තා කටයුතු අමාත්‍යාංශය, පළාත් සභා |
| | | 3.1e පූර්ණ සහභාගිත්වය පහසුකරලීම සඳහා ඉගැන්වුම් ඉගෙනුම් ද්‍රව්‍ය, ඉගෙනුම් පරිසරය සහ භෞතික පහසුකම් සඳහා ප්‍රවේශය දියුණු කිරීම | එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පූර්ණ ප්‍රවේශ හැකියාව සහිත පාසල් සංඛ්‍යාව | ආරම්භය මාස 6 + පසු | අධ්‍යාපන අමාත්‍යාංශය, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය, පළාත් සභා |
| | | | ප්‍රවේශ විය හැකි ආකෘතිවලින් ඇති පාඨම් පොත් හා අනෙකුත් ද්‍රව්‍යවල සංඛ්‍යාව | ආරම්භය මාස 6 + පසු | |
| | | 3.1f ප්‍රධාන ධාරාවේ පාසල්වල ආබාධ සහිත ළමුන්ගේ අධ්‍යාපනය සඳහා ගුරුවරුන්, විදුහල්පතිවරුන්, උපදේශකයින් හා වෙනත් කාර්ය මණ්ඩලය ඇතුළුව නිලධාරින්ගේ මූලික හා අඛණ්ඩ පුහුණුව සඳහා තත්කාලීන උපාය මාර්ග සමාලෝචනය කිරීම | සමාලෝචන වාර්තාව සම්පූර්ණ කිරීම | වසර 1 ඇතුළත | අධ්‍යාපන අමාත්‍යාංශය ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය |
| | | 3.1g සමාලෝචනය මත පදනම්ව, ගුණාත්මක ඉගැන්වීම හා සහය සහතික කිරීම පිණිස යෝග්‍ය මූලික හා අඛණ්ඩ අධ්‍යාපනය සැලසීම මගින් අධ්‍යාපන නිලධාරින්ගේ හැකියාව හා දක්ෂතාව ශක්තිමත් කිරීම | එක් එක් විෂය මාලාවෙහි ආබාධිතබව සඳහා වෙන් කර ඇති කාලයේ ප්‍රතිශතය | වාර්ෂික පදනම මත කෙරී ගෙන යන | අධ්‍යාපන අමාත්‍යාංශය, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය පළාත් සභා |
| | | | අඛණ්ඩ අධ්‍යාපනයෙහි මොඩියුල ඇතුළත් කිරීම | | |
| | | | එක් එක් කලාපයෙහි පුහුණු කර ඇති හා දක්ෂතාව ඇති අධ්‍යාපන නිලධාරින්ගේ ප්‍රතිශතය | | |
| | | 3.1h ප්‍රධාන ධාරාවේ පන්තිවල සහ ක්‍රීඩා හා සංස්කෘතික ක්‍රියාකාරකම් ඇතුළුව | එක් එක් කලාපයෙහි ගුරුවරුන්ට සහය වීම | ආරම්භය මාස 6 + පසු | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | අන්තර්කරණ විෂය බාහිර ක්‍රියාකාරකම්වල දී ආබාධ සහිත ළමුන් සම්බන්ධයෙන් ගුරුවරුන්ට උපකාර කිරීම සඳහා අන්ලුදව්කරුවන් යොදා ගැනීම | පිණිස සේවයේ යොදවා ඇති අන්ලුදව්කරුවන් සංඛ්‍යාව | කෙටි කාලීන | |
| | | 3.1 i ප්‍රධාන ධාරාවේ පාසල්වල ආබාධ සහිත ළමුන් ලියාපදිංචි කිරීම වැඩි කිරීම | එක් එක් කලාපයෙහි ප්‍රධාන ධාරාවේ පාසල්වල ලියාපදිංචි ළමුන්ගේ ප්‍රතිශතය | වසර 1 ඇතුළත | අධ්‍යාපන අමාත්‍යාංශය, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය, පළාත් සභා |
| | 3.1 (2) ප්‍රධාන ධාරාවේ පාසල්වල ආබාධ සහිත ළමුන් පිළිබඳ තොරතුරු ලබාගත හැකිවීම | 3.1(2) a ආබාධ සහිත ළමුන් පාසල් සංගණනයෙහි ඇතුළත් කිරීම | ස්ත්‍රී පුරුෂ භාවය හා ශ්‍රේණිය අනුව ප්‍රධාන ධාරාවේ විශේෂ ඒකක හා විශේෂ පාසල්වල සිටින ළමුන්ගේ ප්‍රතිශතය | ඊළඟ සංගණනයේ දී ආරම්භ කිරීම | අධ්‍යාපන අමාත්‍යාංශය, පළාත් සභා |
| | | 3.1(2) b ආබාධ සහිත ළමුන් අධ්‍යාපන අධීක්ෂණ පටිපාටිවලට ඇතුළත් කිරීම | ස්ත්‍රී පුරුෂ භාවය හා ශ්‍රේණිය අනුව ගිලිහී යාමේ අනුපාතය | මාස 6 ඇතුළත | |
| | | | ළමුන් හා ගුරුවරුන් මුහුණ දෙන බාධක වර්ග හා සංඛ්‍යාව | | |
| | 3.2 ශ්‍රවණ දුබලතා සහ බිහිරි බව සහිත ළමුන්, දෘශ්‍ය දුබලතා හා අන්ධ භාවය ඇති අය, වර්ධනාත්මක ආබාධ ඇති අය, චර්යා ගැටළු ඇති අය, ශාරීරික ආබාධ සහ දුබලතා ඇති අය ගුණාත්මක අන්තර්කරණ අධ්‍යාපනය ලැබීම | 3.2a ශ්‍රවණ දුබලතා හා බිහිරි බව සහිත, දෘශ්‍ය දුබලතා හා අන්ධ භාවය සහිත, වර්ධනාත්මක ආබාධ සහිත, චර්යා ගැටළු සහිත, ශාරීරික ආබාධ සහ දුබලතා සහිත ළමුන් කෙරෙහි ප්‍රධාන ධාරාවේ අධ්‍යාපනයෙහි බලපෑම, තත්ත්වය හා සංස්කෘතිය සමාලෝචනය කිරීම සඳහා සහ ක්‍රියාත්මක කිරීම පිණිස නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා ක්‍රියාකාරී කමිටුවක් පත් කිරීම | වාර්තාව අවසන් කිරීම හා නිර්දේශ ඉදිරිපත් කිරීම | වසර 1 ඇතුළත | අධ්‍යාපන අමාත්‍යාංශය, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය |
| | | 3.2b නිර්දේශ ක්‍රියාත්මක කිරීම | ක්‍රියාත්මක කරන ලද නිර්දේශවල ප්‍රතිශතය | ආරම්භයෙ වසර 1 පසු | |
| | 3.3 ප්‍රධාන ධාරාවෙන් බැහැර අධ්‍යාපනයෙහි නියැලී සිටින සිසුන්ගේ අයිතිවාසිකම් මුදුන් පැමිණවීම | 3.3a විශේෂ පාසල්වල තත්ත්වය, විෂයමාලාව, සංස්කෘතිය හා බලපෑම සමාලෝචනයකොට ඒවා වැඩිදියුණු කිරීම හා අවශ්‍ය වන්නේ නම් වැඩි කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස ක්‍රියාකාරී කමිටුවක් පත් කිරීම | වාර්තාව අවසන් කිරීම හා නිර්දේශ ඉදිරිපත් කිරීම | වසර 1 ඇතුළත | අධ්‍යාපන අමාත්‍යාංශය |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | 3.3b පියවර ක්‍රියාත්මක කිරීම | ක්‍රියාත්මක කරන ලද නිර්දේශවල ප්‍රතිශතය | ආරම්භය වසර 1 පසු | |
| | | | 3.3c විශේෂ අධ්‍යාපනය සලසන යෝග්‍ය පාසල් සියල්ලම ලියාපදිංචි කිරීම සඳහා පියවර ගැනීම | ලියාපදිංචි කරන ලද විශේෂ පාසල් සංඛ්‍යාව | මාස 3 ඇතුළත | අධ්‍යාපන අමාත්‍යාංශය |
| | | | 3.3d විශේෂ පාසල් ඒකකවල තත්ත්වය, විෂයමාලාව, සංස්කෘතිය හා බලපෑම සමාලෝචනය කොට ඒවා වැඩිදියුණු කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස ක්‍රියාකාරී කමිටුවක් පත් කිරීම | වාර්තාව අවසන් කිරීම හා නිර්දේශ ඉදිරිපත් කිරීම | වසර 1 ඇතුළත | අධ්‍යාපන අමාත්‍යාංශය |
| | | | 3.3e පියවර ක්‍රියාත්මක කිරීම | ක්‍රියාත්මක කරන ලද නිර්දේශවල ප්‍රතිශතය | ආරම්භය වසර 1 පසු | |
| 4 | අවිධිමත් අධ්‍යාපනය | 4.1 සියලු වර්ගයේ ආබාධ සහිත පාසල් නොයන ළමුන් සඳහා අවිධිමත් අධ්‍යාපන මධ්‍යස්ථානවල වැඩිකල හා සාධාරණ අවස්ථා තිබීම | 4.1a සියලු වර්ගයේ ආබාධ සහිත ළමුන් හා තරුණ පුද්ගලයන් අන්තර්කරණය කිරීම සඳහා මධ්‍යස්ථානවල උපදේශකයන්ගේ පෙළඹවීම හා හැකියාව ශක්තිමත් කිරීම | අන්තර්කරණ මධ්‍යස්ථානවල සංඛ්‍යාව<br>අවිධිමත් අධ්‍යාපනය සඳහා පුහුණු කරනු ලැබූ උපදේශකයන්ගේ ප්‍රතිශතය | වසර 3 ඇතුළත | අධ්‍යාපන අමාත්‍යාංශය, පළාත් සභා |
| | | | 4.1b සියලු වර්ගයේ ආබාධ සහිත සිසුන් අන්තර්කරණය කිරීම සඳහා ප්‍රවේශ විය හැකි බව, ප්‍රවේශවිය හැකි ආකෘතිවල ඉගැන්වීම් ඉගෙනුම් ද්‍රව්‍ය හා අනෙකුත් පහසුකම් සැපයීම | උපදේශනය සම්බන්ධයෙන් පුහුණු කරනු ලැබූ උපදේශකයන්ගේ ප්‍රතිශතය<br>සිසුන් හා උපදේශකයන් මුහුණ දුන් බාධක සංඛ්‍යාව / වර්ගය | | |
| | | | 4.1c අවිධිමත් අධ්‍යාපනයෙන් ප්‍රතිලාභ ලැබිය හැකි ළමුන් හා තරුණ පුද්ගලයන් ලියාපදිංචි කිරීම සඳහා දෙමාපියන් හා රැකවරණ සලසන්නන් පෙළඹවීම | අවිධිමත් අධ්‍යාපන මධ්‍යස්ථානවල සිසුන්ගේ ප්‍රතිශතය | වසර 3 ඇතුළත | අධ්‍යාපන අමාත්‍යාංශය, පළාත් සභා, සමාජ සේවා අමාත්‍යාංශය |
| 5 | උසස් අධ්‍යාපනය | 5.1 විවිධ වර්ගයේ ආබාධ සහිත සිසුන් වෙනුවෙන් උසස් අධ්‍යාපනය සඳහා වැඩිකල හා සාධාරණ අවස්ථා තිබීම | 5.1a සියලු විශ්වවිද්‍යාලවල හා අනෙකුත් උසස් අධ්‍යාපන මධ්‍යස්ථානවල සියලු වර්ගයේ ආබාධ සහිත සිසුන් අන්තර්කරණය කිරීම සඳහා ප්‍රවේශ විය හැකි බව, ප්‍රවේශවිය හැකි ආකෘති වල ඉගැන්වීම්, ඉගෙනුම් ද්‍රව්‍ය හා අනෙකුත් පහසුකම් සැපයීම | අන්තර්කරණ විශ්වවිද්‍යාල පීඨවල /මධ්‍යස්ථානවල සංඛ්‍යාව<br>ප්‍රවේශ විය හැකි විශ්වවිද්‍යාල පීඨවල /මධ්‍යස්ථානවල සංඛ්‍යාව<br>ප්‍රමාණවත් පහසුකම් ඇති විශ්වවිද්‍යාල පීඨවල /මධ්‍යස්ථානවල සංඛ්‍යාව | ආරම්භය වසර 1 + පසු | උසස් අධ්‍යාපනය අමාත්‍යාංශය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, විශ්වවිද්‍යාල, උසස් අධ්‍යාපන |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | සිසුන් හා ගුරුවරුන් මුහුණ දුන් බාධක සංඛ්‍යාව / වර්ගය | | මධ්‍යස්ථාන |
| | | | | පීඨ අංශ අනුව එක් එක් විශ්වවිද්‍යාලයේ ලියාපදිංචි ශිෂ්‍යයන්ගේ ප්‍රතිශතය | | |
| | | | 5.1b ආබාධ සහිත සිසුන් සමග අන්තර්ක්‍රියාකාරී වන අන්දම හා ඔවුන්ට උපකාර කරන ආකාරය පිළිබඳව ආබාධ සහිත සිසුන් ඇතුළත් අධ්‍යයනාංශවල කාර්ය මණ්ඩලය සහ අදාළ විශ්වවිද්‍යාල පරිපාලන හා සහය කාර්ය මණ්ඩල සංවේදී කිරීම | සංවේදී කරන ලද කාර්ය මණ්ඩල සංඛ්‍යාව | ආරම්භය මාස 6 + පසු | |
| | | 5.2 ආබාධිත බව සිය කාර්යයන්හි අන්තර්කරණය කිරීම සහ ආබාධිත බව සම්බන්ධ වැඩවල බහු පැතිකඩ අංශයන්හි ගුණාත්මක යෙදවුම් සිදු කිරීම සඳහා යෝග්‍ය දැනුම හැකියාවන් හා ආකල්පවලින් යුත් මනාව සුදුසුකම් ලත් රජයේ නිලධාරීන්, වෘත්තීයවේදීන්, වෘත්තිකයන්, විශේෂඥයන්, අධ්‍යාපනඥයන් හා පර්යේෂකයන්ගේ සංචිතයක් තිබීම | 5.2a ආබාධිත බව සම්බන්ධ බහුවිධ විෂය ධාරා සහ ක්ෂේත්‍ර පිළිබඳ ප්‍රථම උපාධි හා පශ්චාත් උපාධි වැඩසටහන් සහ සහතික පත්‍ර, ඩිප්ලෝමා සහ වෙනත් අධ්‍යාපන පාඨමාලා සකස් කොට ක්‍රියාත්මක කිරීම | එක් එක් විෂය ධාරාවේ / ක්ෂේත්‍රයේ පවත්වන ලද ආබාධිත බව හා සම්බන්ධ වැඩසටහන් හා පාඨමාලා සංඛ්‍යාව | ආරම්භය වසර 1 + පසු | උසස් අධ්‍යාපනය අමාත්‍යාංශය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, පශ්චාත් උපාධි ආයතන, විශ්වවිද්‍යාල, උසස් අධ්‍යාපන මධ්‍යස්ථාන |
| | | | | එක් එක් වැඩසටහන / පාඨමාලාව මගින් සුදුසුකම් ලැබූ නිලධාරීන් සංඛ්‍යාව | | |

## සිව් වන තේමා ක්ෂේත්‍රය : වැඩ සහ සේවා නියුක්තිය

එකසත් ජාතීන්ගේ ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තියේ 27 වන ව්‍යවස්ථාව මගින් " ආබාධ සහිත තැනැත්තන්ට අන්‍යයන් සමග සමාන පදනමෙන් යුතුව වැඩ කිරීමට ඇති අයිතිය පිළිගනී. මෙයට ආබාධ සහිත තැනැත්තන්ට විවෘත, අන්තර්කරණය වූ හා ප්‍රවේශ විය හැකි ශ්‍රම වෙළඳපළක සහ වැඩ පරිසරයක නිදහසේ තෝරා ගන්නා ලද හෝ පිළිගත් වැඩ මගින් ජීවිකාවක් උපයාගැනීමේ අවස්ථාව ඇතුළත් වේ".

තව ද ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය මගින් වෙනත් විධිවිධාන අතර සියලු ආකාරයේ සේවා නියුක්තිය මත පදනම්ව වෙනස්කම් කිරීම් (discrimination) තහනම් කරන අතර වෘත්තීය පුහුණුව සඳහා ප්‍රවේශය ප්‍රවර්ධනය කිරීම, ස්වයං රැකියා සඳහා අවස්ථා ප්‍රවර්ධනය කිරීම සිදු කරන අතර සේවා ස්ථානයෙහි සාධාරණ ඉඩකඩ සලසන ලෙස ඉල්ලා සිටී.

*ආබාධිත බව පිළිබඳ ගෝලීය වාර්තාව, 235 පිටුව*

| | කේන්ද්‍රීය ක්ෂේත්‍රය | අපේක්ෂිත ප්‍රතිඵලය | ක්‍රියාකාරකම | ප්‍රධාන කාර්ය ඉටු කිරීමේ දර්ශකය | කාල රාමුව | වගකිවයුතු ආයතන/ය |
|---|---|---|---|---|---|---|
| 1 | වැඩ, සේවා නියුක්තිය හා වෘත්තීය පුහුණුව සම්බන්ධ ජාතික ප්‍රතිපත්ති, නීති, උපාය මාර්ග සහ සැලසුම් | 1.1 ප්‍රධාන ධාරාවේ වැඩ, සේවා නියුක්තිය හා වෘත්තීය පුහුණුව සම්බන්ධ ජාතික ප්‍රතිපත්ති, නීති, උපාය මාර්ග සහ සැලසුම් සමාලෝචනය කිරීම සහ ආබාධිත බව සැලකිල්ලට ගැනීම සඳහා සංශෝධනය කිරීම | 1.1a ප්‍රධාන ධාරාවේ වැඩ (සේවයට බඳවා ගැනීම් ඇතුළුව) සේවා නියුක්තිය හා වෘත්තීය පුහුණුව සම්බන්ධ ජාතික ප්‍රතිපත්ති, නීති, උපාය මාර්ග සහ සැලසුම් පිළිබඳ ඊළඟ සමාලෝචනවල දී ආබාධ සහිත පුද්ගලයන් අන්තර්කරණය කිරීම | ආබාධ සහිත පුද්ගලයන්ගේ සේවා නියුක්ති හා සේවා වියුක්ති අනුපාතයන් | ආරම්භය වසර 1 පසු (+ = සහ කෙරී ගෙන යන) | කම්කරු අමාත්‍යාංශය, තරුණ කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය, පළාත් සභා |
| | | | 1.1b රාජ්‍ය අංශයේ (අනුමත සේවක සංඛ්‍යාවලින්) 3% ක් ආබාධ සහිත තැනැත්තන් සඳහා ක්‍රියාත්මක කිරීම | බඳවා ගැනීමේ උපමාන සංශෝධනය කිරීම<br>රාජ්‍ය අංශයේ ආයතනවල සේවකයන්ගේ ප්‍රතිශතය | වසර 1 ඇතුළත | කම්කරු අමාත්‍යාංශය, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය, පළාත් සභා |
| 2 | වැඩ හා සේවා නියුක්තිය සඳහා සමාන ප්‍රවේශය | 2.1 සියලු වර්ගවල ආබාධ සහිත පුද්ගලයන් සඳහා අන්තර්කරණ වෘත්තීය පුහුණුව, කාර්මික අධ්‍යාපනය, වැඩ හා සේවා නියුක්තිය සඳහා සාධාරණ | 2.1a ප්‍රධාන ධාරාවේ නිපුණතා සංවර්ධනය, වැඩ සහ සේවා නියුක්තිය සඳහා බාධක සහ යහපත් භාවිතාවන් නිශ්චය කිරීම සඳහා අධ්‍යයනයක් කිරීම පිණිස ක්‍රියාකාරී කණ්ඩායමක් පත් කිරීම | නිර්දේශ සහිත වාර්තාව ලබාගත හැකිවීම | වසර 1 ඇතුළත | කම්කරු අමාත්‍යාංශය, තරුණ කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය, |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | අවස්ථා | 2.1b නිර්දේශ ක්‍රියාත්මක කිරීම | බාධකවලින් තොර වැඩ සටහන් හා සේවා ස්ථාන සංඛ්‍යාව | ආරම්භය වසර 1 පසු | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය |
| | | | 2.1c ප්‍රවේශය වැඩි කිරීම හා පුළුල් කිරීම සඳහා ඉගෙනුම් හා අත්දැකීම් බෙදා ගැනීම | පාර්ශවකරුවන්ගේ රැස්වීම් සංඛ්‍යාව<br>හමු වූ පාර්ශවකරුවන් සංඛ්‍යාව | ආරම්භය වසර 1 + පසු | |
| 3 | වැඩ සඳහා මාර්ගෝපදේශ හා උපදේශන සකස් කිරීම | 3.1 අවශ්‍ය සහයෝගය පිළිබඳ තක්සේරුවක් සහ රැකියා අවස්ථා සහ පවත්නා වෙළඳපළ පිළිබඳ තොරතුරු සහිතව වෘත්තිය පුහුණුව, වැඩ සහ සේවා නියුක්තිය සඳහා නිවස හා ප්‍රජාව පදනම් කරගත් සූදානම් කිරීම, මග පෙන්වීම හා උපදේශනය | 3.1a ප්‍රජා මූලික පුනරුත්ථාපනය, නිවස මූලික කර ගත් හා ප්‍රජා සංවර්ධන වැඩසටහන්වලදී අවශ්‍ය වන්නා වූ සහය පිළිබඳ තක්සේරුවක් ඇතිව පුද්ගලයන් හා පවුල් සූදානම් කිරීම, ඔවුනට මග පෙන්වීම හා උපදේශනය ඇතුළත් කිරීම | තක්සේරු ආකෘති<br>සේවාවන් සලසනු ලබන ප්‍රජා මූලික පුනරුත්ථාපනය, නිවස මූලික කර ගත් හා ප්‍රජා සංවර්ධන වැඩසටහන් සංඛ්‍යාව | මාස 6 ක් තුළ | සමාජ සේවා අමාත්‍යාංශය, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය පළාත් සහා රාජ්‍ය නොවන සංවිධාන |
